# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/16 - 2020 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා - 2020.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/22/70/2009

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.07.18 දින දරන නියෝගයෙන්, බේරුම් කිරීම මගින් විසඳීම සඳහා කුරුණෑගල, කුඩාගල්ගමුව, වැව රවුම් පාර හි පදිංචි ඒ. එම්. ජේ. අතපත්තු මයා සහ කොළඹ 05, කිරුළ පාර, නො. 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3396 දරන ප්‍රදානය 2019.08.19 දිනැති හා අංක 2137/7 දරන *රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2020.01.14 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,<br>
කම්කරු කොමසාරිස් ජනරාල්,

2020 පෙබරවාරි මස 14 දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

යොමු අංකය : IR/22/70/2009

කාර්මික අධිකරණයේදී ය.

ඒ. එම්. ජේ. අතපත්තු මයා,<br>
වැව රවුම් පාර,<br>
කුඩාගල්ගමුව,<br>
කුරුණෑගල.

*පළමු පාර්ශවය*

නඩු අංකය : ඒ/3396 සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,<br>
අංක 200,<br>
කිරුල පාර,<br>
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරාවුල

### ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා ) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.07.18 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.


1A – G 32091 — 24 (2020/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඒ අනුව මා විසින් 2019.06.27 දින ලබා දුන් ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2137/7 හා 2019 අගෝස්තු 19 දින ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර 1950 අංක 43 දරන (සංශෝධිත) කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය ප්‍රකාර අර්ථ නිරූපනයක් සඳහා මා වෙත යොමු කර ඇත. ඒ අනුව අර්ථ නිරූපනය පහත පරිදි වේ.

එම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල 2020.02.29 දිනට ප්‍රථම සහකාර කම්කරු කොමසාරිස් නමින් කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස මෙයින් නියෝග කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත බව සහතික කරමි.

2020.01.14 වන දින කාර්මික අධිකරණයේ දී ය.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

03 - 413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.